# සංස්කෘත දෘශ්‍ය කාව්‍යයේ ආරම්භය

සංස්කෘත දෘශ්‍ය කාව්‍යයේ ආරම්භය කවද කෙසේ සිදුවිණි ද යි නිශ්චිත ව පැවසිය නො හැක. විද්‍යමාන ප්‍රථම කෘතියෙහි පවා දක්නට ලැබෙන දියුණු ලක්ෂණ නිසා නිසැක ව ම ක්‍රි.පූ. අවදියට ඇතුළත් කළ හැකි බැව් විචාරක මතය යි. වීරකාව්‍යයන්හි යෙදෙන නට, නාට්‍ය, නාටක, ශෛලූෂ, සමාජ වැනි යෙදුම් නාට්‍ය කලාව සහ සම්බන්ධ ය. එලෙස ම පසු කලෙක නාට්‍යවෘන්දය හැඳින්වීම සඳහා භාවිත කුශීලව යන්න රාම ගේ පුතුන් හැඳින්වීම සඳහා රාමායණයෙහි යෙදෙනු දැකගත හැකි ය. හරිවංශයේ එනම් මහාභාරතයේ අවසන පෙනෙන උපග්‍රන්ථයෙහි රාමායණය ඇසුරෙන් කළ නාට්‍යයක් ගැන සඳහන් ය. මේවා සංස්කෘත නාට්‍යය පිළිබඳ දැකිය හැකි ඉපැරණි ම සාක්ෂ්‍ය වේ. භරතවරුන්, භාරතනාට්‍යම් සහ භරතමුනි ගේ ද සබැඳියාවක් පැවතිය හැකි ය. වීර කාව්‍යයන්හි පැනෙන නාට්‍ය පිළිබඳ පුවත් බෞද්ධ සාහිත්‍යාගත තොරතුරුවලින් ද තහවුරු වේ. ථෙරවාදී බෞද්ධ ත්‍රිපිටකයේ ද නොයෙක් විට නාට්‍ය සහ රංගකලා පිළිබඳ, නළුනිළියන් ගැන, ගිරග්ගසමජ්ජ වැනි නෘත්‍යයන් ගැන සඳහන් වේ. නාට්‍ය කලාවේ ඉපැරණි බැව් ප්‍රකටවන වැදගත් ම සාක්ෂ්‍ය කිහිපයක් ඉපැරණි ව්‍යාකරණ කෘතීන් ගෙන් හමුවේ. පාණිනී (ක්‍රි.පූ. 4සියවස) අෂ්ටාධ්‍යායෙහි ශිලාලින් සහ කෘෂාස්ව යන දෙදෙනෙකුගේ නටසූත්‍ර නම් කෘතියක් හෝ කෘති ගැන සඳහන් කරයි. එයට භාෂ්‍ය කළ පතඤ්ජලී (ක්‍රි.පූ. 02 සියවස) "එතෙ ශොභනිකා ප්‍රත්‍යක්ෂං කංසං ඝාතයන්ති ප්‍රත්‍යක්ෂං බලිං බන්ධයන්ති. කෙචිත් කාලමුඛාඃ කෙචිත් රක්ත මුඛාඃ" යන ලෙසින් නාට්‍යමය අවස්ථාවක් විස්තර කරයි.

මෙලෙස ඉපැරණි වූ භාරතීය නාට්‍ය කලාවේ ප්‍රභවය කෙලෙස සිදුවිණි ද යි පෙර අපර දෙදිග විද්වත්හු රැසක් ම විමසීම් කළහ. වීබර්, වින්ඩිෂ්, පිෂෙල්, ඔල්ඩන්බර්ග්, සිල්වන්ලෙවි, හිලෙබ්‍රාන්ට්, මැක්ස්මුලර්, ෂ්‍රෝඩර්, කොනොව්, කීත්, විල්සන්, විජේසේකර, ශෛබර්, දේ, දස ගුප්ත ආදීහු එහිලා ප්‍රමුඛ වූහ. තිලකසිරි, සේනානායක, මාරසිංහ වැනි ශ්‍රී ලාංකේය විද්වත්හු එකී මත සමාලෝචනය කරමින් වඩාත් නිවැරදි නිගමනයකට අවතීර්ණ වීමට මංපෙත් සැලසූහ. පෙර කී විද්වත් පිරිස විසින් විටින් විට ඉදිරිපත් කළ මත රැසකි. මූලික අදහස් කිහිපයක් තුළ මෙම මත සියල්ල ගොනු කළ හැකි ය. නමුත් වෙන් වෙන් ව විමසා බැලීම උචිත ය. එලෙස බලන විට මතවාද 13ක් පමණ හඳුනා ගත හැකි ය.

- දිව්‍යමය ප්‍රභවයක් සහිත ය.
- වේදයේ සංවාද සූත්‍ර ඇසුරින් බිහිවිය.
- වෛදික පුද පූජා චාරිත්‍ර මුල් විය.
- මළවුන් පිදීමේ සිරිතක් ආශ්‍රය විය.
- ඉපැරණි ජන සම්ප්‍රදයක් ඇසුරු කරගෙන බිහිවිය.
- කෝලම් නාටක ආශ්‍රය විය.
- යාත්‍රානම් උත්සව විධිය ආශ්‍රයෙනි.
- රූකඩ නාට්‍ය ඇසුරෙනි.

- ඡායා නාටක ඇසුරෙනි.
- බුද්ධ කාලයටත් පෙර සිට පැවති ජන නාට්‍ය කලාවක් ආශ්‍රයෙනි.
- ඉන්දු නිම්න යුගයේ සිට පැවති ද්‍රාවිඩ සම්ප්‍රදයක විකාශයකි.
- ශක බලපෑමෙනි.
- ග්‍රීක බලපෑමෙනි.

යනු එකී මත සමුදය යි.

මේ සියල්ලට ම පදනම් වූ කිසියම් ලක්‍ෂණයක්, හේතුවක් සංස්කෘත දෘශ්‍ය කාව්‍යයන් තුළින් දැක ගත හැකි ය. එක් එක් විද්වතෙක් තම තමන්ගේ මත ඉදිරිපත් කිරීමෙහි ලා හේතු සාධක කරගත්තේ කවර කරුණු දැයි විමසා බලනු වටී.

01. කිසියම් විශිෂ්ට ගණයේ ශිල්පයක්, ශාස්ත්‍රයක්, නිර්මාණයක් වී නම් එහි කතෘත්වය දෙවියන් වෙත පැවරීම ඉපැරණි භාරතීය සම්ප්‍රදය යි. ඒ අනුව යමින් නාට්‍ය ශාස්ත්‍ර නම් අති විශිෂ්ට නාට්‍ය නිර්මාණය පිළිබඳ ශිල්ප ග්‍රන්ථය රචනා කළ භරත ඇදුරුතුමා නාට්‍යය හෙවත් දෘශ්‍ය කාව්‍යයේ ආදි කතෘත්වය මහාබ්‍රහ්ම වෙත පවරයි. එයට අනුව දිනක් "මහේන්‍ද්‍ර ප්‍රමුඛ දෙවියන් විසින් මහාබ්‍රහ්ම අමතා ශ්‍රව්‍ය දෘශ්‍ය ගෝචර වූ කිසියම් විනෝද ක්‍රීඩාවක් ඇතොත් අපි සතුටු වෙමු. මේ වේද ගායනා ශුද්‍ර ජාතීනට ඇසෙන්නට සැලසිය නොහැකි ය. එහෙයින් සියලු වර්ණයනට ගෝචර වූ පස්වැනි වෙනත් වේදයක් මවනු මැනවි යි පැවසිණි. ඒ ඉල්ලීමට අනුව සියලු ශාස්ත්‍රයන්ගේ හරය ගෙන සියලු ශිල්ප ප්‍රදර්ශනය කරන ඉතිහාසය අන්තර් ගත සතර වේදයෙන් තද්තද්දංග සම්භව වූ පස්වැනි වේදයක් ලෙස නාට්‍ය වේදය නිර්මාණය කළේ ය. එහි දී ඍග්වේදයෙන් පාඨ්‍ය (සංවාද), සාමවේදයෙන් ගීත (සංගීතය) ද යජුර්වේදයෙන් අභිනය ද, අථර්ව වේදයෙන් රසයන් ද උකහා ගැනිණි. ඉන්පසු එය සුරෙන්‍ද්‍රයාගේ අනුමැතියෙන් භරත මුණි සහ පුතුන් සියය වෙත පැවරුණි. පසු ව විශ්වකර්ම විසින් සැකසුණු නාට්‍ය ගෘහයේ ශිවගේ තාණ්ඩව සහ පාර්වතීගේ ලාස්‍ය නෘත්‍යයෙන් ද විෂ්ණු ඉදිරිපත් කළ සිව් වැදැරුම් නාට්‍ය රීතීන් ගෙන් ද පෝෂිත ව දේව-දනව සංග්‍රාමය භරත ප්‍රමුඛ පිරිස විසින් නාට්‍යාකාරයෙන් රඟ දැක්විණි.

ඓතිහාසික වශයෙන් නාට්‍යයේ ප්‍රභවය සම්බන්ධයෙන් එතරම් වැදගත් පුවතක් හෙළි නොකරන මිත්‍යා කථාවක් ලෙසින් හැඟී යන භරතගේ මෙම පුවතින් මතුවන වැදගත් කරුණු රැසකි. වේදයක තත්ත්වයෙහි ලා පැරැන්නන් විසින් නාට්‍ය කලාව පූජාර්හ ව සැලකූ බව එයින් එක් කරුණකි. සතර වේදයෙන් හා දෙවිවරුන් වෙතින් නාට්‍යයේ විවිධ අංග උකහාගත් ආකාරය පැවසීමෙන් නාට්‍යයක අන්තර්ගතය හා ආකෘතිය පිළිබඳ විචක්‍ෂණ දැනුමකින් යුතු ව ක්‍රි.ව. 2 සියවසේ දී පවා සිටි බවත් එයින් පෙනී යයි. වේද සූක්ත සහ පුද සිරිත් ඇසුරෙන් වූ ආගමික ප්‍රභවයක් පිළිබඳ නවීන විචාරකයන් ප්‍රකාශ කරන දෙය ම භරත වෙනත් අයුරකින් පැවසීමට දුරු තැතක් ලෙසින් මෙම ප්‍රබන්ධය හැඳින්විය හැකි ය. ඊර්ෂ්‍යා - ක්‍රෝධාදියෙන් මුලා වී, ග්‍රාම්‍ය චර්යාවන් ගෙන් යුතු ප්‍රජාව සන් මාර්ගය කරා යොමුකිරීමේ පරමාර්ථයක් ද උක්ත ප්‍රවාදයෙන් කියැවේ.

02. නාට්‍යයේ ප්‍රභවය පිළිබඳ මීළඟට හමුවන වැදගත් ම අදහසක් නම් "ඍග් වේදයේ සංවාද සූක්ත ඇසුරු කරගෙන ඇරඹිනැ"යි ඕල්ඩන්බර්ග් ඉදිරිපත් කළ මතය යි. පසු ව එය මැක්ස්මුලර්, සිල්වන්ලෙවී, ශ්‍රෝඩර්, හර්ටල් වැනි විද්වතුන් විවිධ සාක්ෂ්‍ය සහ සාධක මගින් තහවුරු කරන්නට උත්සාහ කැරිණි. ඍග්වේදය පුරා ම දෙදෙනෙකු, තිදෙනෙකු හෝ ඊට වැඩි දෙනෙකු ගේ සහභාගීත්වයෙන් සිදුවන සංවාදමය සූක්ත පසළොසක් පමණ දක්නට ලැබේ. යම-යමී (x. 10) පුරුරවස්-ඌර්වශී (x. 95) අගස්ත්‍ය-ලොපාමුද්‍රා (1. 179) ආදිය එලෙස දෙදෙනෙකු අතර කැරෙන සංවාදමය සූක්ත වේ. I. 179 සූක්තය අගස්ත්‍ය-ලොපාමුද්‍රා සහ පුත්‍රයා අතර කැරේ. ඉන්ද්‍ර - අදිති - වාමදෙව අතර සිදුවන සංවාදයක් ඇතුළත් iv. 18 සූක්තය තවත් ත්‍රිපුද්ගල සංවාද සූක්තය කි. මේ හැරුණ විට පුද්ගලයෙක් සහ පිරිසක් අතර සිදුවන සංවාද ලෙස iii.33, vii.33 සහ x.108 සූක්ත දැක්විය හැකි ය. හර්ටල් පවසන්නේ මේ සංවාද නළුවන් දෙදෙනෙකු අතර සිදුවන්නට ඇති බව යි. එලෙසින් ම ඍග්වේදයේ සඳහන් ආත්ම භාෂණමය (Monologues) සූක්ත (x. 119, 97, 34) සහ මණ්ඩූක සූක්තය (vii. 103) නාට්‍යමය ලක්ෂණ මැනවින් ප්‍රකට කරන සූක්ත ලෙස ඔවුහු දක්වති.

03. වෛදික පුද පූජා සිරිත් හෙවත් යාග හෝම විධි ඇසුරින් නාට්‍යමය බිහිවෙන්නට ඇත යනු නාට්‍යයේ ප්‍රභවය පිළිබඳ ඉදිරිපත් ව ඇති තවත් නොසලකා කළ නොහැකි මතයකි. හිලේබ්‍රාන්ට් සහ කීත් මෙම මතය ඉදිරිපත් කිරීමෙහිලා ප්‍රමුඛයො වෙති.

- සෝම යාගයේ දී සෝම මිළ දී ගැනීම.
- මහා ව්‍රත යාගය (භූමි දුන්දුභි වාදනය, හෝතෘ හෝවිල්ලක හිඳුවා පැදවීම, බ්‍රහ්මචාරියෙකු වෙසඟනක සමග කරන පරුෂ සංවාදය, රෙදි කැබැල්ලකට ආර්‍ය්‍ය ශුද්‍ර දෙදෙනෙකු අතර සිදුවන සටන. දිය කළ ගත් තරුණියන් ගින්න වටා නැටීම)
- අශ්වමේධ යාගයේ දී පූජකයා, කන්‍යා සමූහය සහ රාජ පරිචාරික ස්ත්‍රීන් සමග යෙදන පරුෂ සංවාදය ආදිය අනුකරනාත්මක සහ නාට්‍යාත්මක ලක්ෂණවලින් යුක්ත ය. පසුකාලීන ව නාට්‍යයේ ප්‍රභවයට ඒ හේතුවන්ට ඇතැයි කීත් පවසයි.

04. ග්‍රීක නාට්‍යයේ ප්‍රභවය පිළිබඳ විශේෂ විමර්ශනයක් කළ රිජ්වේගේ අදහස වූයේ " මළගිය ඇත්තන් වෙනුවෙන් කළ නැටුම්වලින්" ග්‍රීක නාට්‍යය ඇරඹුණු බව යි. ඒ අදහස ම සංස්කෘත නාට්‍යයේ ප්‍රභවය පිළිබඳ විමසීමෙහි දී ද ඔහු විසින් භාවිත ය. ඒ අනුව ජාතික වීරයින් සහ ශ්‍රේෂ්ඨ නායකයන් සිහිපත් කොට ඔවුන්ගේ උදාර චරිතයන්ට ගරු කිරීමක් වශයෙන් පැවැත්වුණු නාට්‍ය සංස්කෘත නාට්‍යයට ද මූල බීජ සපයන්ට ඇත යනු ඔහුගේ මතය විය. කෘෂ්ණ පූජාව සහ කෘෂ්ණ වැනි නැසී ගිය වීරයින්ගේ චරිත නළුවන් විසින් නාට්‍යයන්හි නිරූපිත වීම සිය මතය සනාථ කෙරෙන සාධක ලෙස ඔහු ඉදිරිපත් කරයි.

කෙසේවෙතත් රිජ්වේගේ මෙම අදහස ප්‍රශස්ත මතයක් ලෙස බොහෝ විචාරකයෝ නො පිළිගනිත්. මෙය ග්‍රීක නාට්‍යය පිළිබඳ ව සේ ම භාරතීය නාට්‍යය පිළිබඳ වත් කැරුණු නිවැරදි අදහසක් නොවේ ය යනු ඔවුන්ගේ මතය යි. භාරතීය වෛදික ආගමට සේ ම වෙනත් විවිධ ආගම් දර්ශනවලට කොපමණ දුරට මළවුන් පිදීම බලපාන්නට ඇත්ද යන්න වෙන ම

විමසිය යුතු කරුණකි. නමුත් "නාට්‍යය සම්බන්ධයෙන් එබඳු බලපෑමක් කිසිසේත් දක්නට නොලැබේ" යනු ඒ පිළිබඳ බහුතර මතය යි.

05. භාරතීය නාට්‍යයේ ප්‍රභවය පොදුජන පදනමකින් වීය යනු හිලේ බ්‍රාන්ට් සහ කොනොව් යන විද්වතුන්ගේ මතය යි. ජනතාව අතර ප්‍රචලිත අනුකරණාත්මක නාට්‍ය විශේෂයකින් සකු නාටකය බිහිවුණි යැයි ඔවුහු පවසති. සංස්කෘත සහ විවිධ ප්‍රාකෘත භාෂා සම්මිශ්‍රණය, ගද්‍ය පද්‍ය සම්මිශ්‍රණය ආදිය මෙකී ජනපදනම සනාථ කරන සාධක ලෙස හිලේබ්‍රාන්ට් පවසයි. නුගත් මෝඩ බමුණකු ලෙස නිරූපිත විදූෂක චරිතය ලෞකික හේතුවකින් නාට්‍යය ප්‍රභවය වූයේය යන මතය වඩාත් තහවුරු කරන බව පැවසේ. පැරණි පුද පූජාවන් ඇසුරෙන් නාට්‍ය පැන නැගුණේය යන අදහස ප්‍රතික්ෂේප නොකොට ම "අනුකරණාත්මක ජන නාට්‍ය කලාවක් වෛදික සමයට පෙර සිට ම ප්‍රචලිත වූ බවත්, එය සංස්කෘත නාට්‍යය කෙරෙහි බලපාන්නට ඇති බවත්[5] බ්‍රාන්ට් සහ කොනොව් තවදුරටත් පවසති.

06. ආගමික පූජාවිධීන්ගේ සහ ජන නාට්‍ය කලාවක සම්මිශ්‍රණයෙන් සංස්කෘත නාට්‍යය බිහිවුණි යනුවෙන් පැවසූ හිලේබ්‍රාන්ට් ඒ මතයට තවදුරටත් ඉදිරියට ගෙන යමින් කෝලම් වැනි හාස්‍යජනක ජන සම්ප්‍රදයක් සංස්කෘත සම්භාව්‍ය නාට්‍යයට මුල්වන්නට ඇතැයි ප්‍රකාශ කරයි. සූත්‍රධාර හා නටී අතර පැවැත්වෙන සංවාදය මෙම කෝලම් වැනි සම්ප්‍රදයක බලපෑම ප්‍රබල ව ප්‍රකට කරන බව ඔහු පවසයි. ඒ සමඟ ම විදූෂකගේ චරිතයේ එන හාස්‍ය ජනක චරිත ලක්‍ෂණ කොලම්වල පැනෙන විගඩමා හෙවත් කවටයා (බහුබූතයා) ගේ චරිතය විකාශනය කිරීමෙන් නිපදවාගන්නට ඇත යනුවෙන් ඔහු තවදුරටත් පවසයි.

07. ලෞකික හේතුවක් ජන නාට්‍යය පදනමක් පිළිබඳ අදහස ඉදිරිපත් කළ ස්ටෙන් කොනොව් සිය පූර්වෝක්ත මතයන්ට පටහැනි නොවන තවත් අදහසක් ඉදිරිපත් කොට ඇත. ඒ "යාත්‍රා" නම් ඉපැරණි ජනතා සැනකෙළිය සංස්කෘත නාට්‍යයට මුල් වන්නට ඇති බව යි. කුලභේදයකින් හා පන්තිභේදයකින් තොරව සාමාන්‍ය මහජනයා අතර ඈත අතීතයේ සිට ම පැවතෙන උත්සව විශේෂයක් ලෙස කොනොව් යාත්‍රා උත්සවය හඳුන්වයි. එහි සැනකෙළි ශ්‍රීය වර්ධනය කිරීමේ පරමාර්ථයෙන් රඟ දැක්වුණු ජන නාට්‍යයක් සම්.සං. නාට්‍යයට මුල්වන්නට ඇත යනු මෙහි දී ඉදිරිපත් වුනු මතය යි. භවභූති වැනි විශිෂ්ට නාට්‍ය රචකයන්ගේ කෘතීන් පවා පසුකලෙක මෙම යාත්‍රා උත්සව අවස්ථාවන්හි රඟ දැක්වී තිබීම සිය මතය තහවුරු කැරෙන සාධක ලෙස කොනොව් ඉදිරිපත් කරයි.

08. සංස්කෘත නාට්‍යයේ ප්‍රභවය පිළිබඳ වෙනස් ආකාරයක විශේෂ මතයක් ඉදිරිපත් කළ විද්වතෙක් ලෙස R. Pishel සඳහන් කළ හැකි ය. ඔහු පවසන ආකාරයට "සංස්කෘත නාට්‍යයේ සම්භවය රූකඩ නාට්‍යයේ අභිවර්ධනයෙන් සිදුව ඇත." ලොව පුරා රටවල් රැසකට ඉතා ඈත අතීතයේ සිට ම රූකඩ නාට්‍ය ජනප්‍රියව පැවති බව පවසන පිෂෙල් භාරතය එහි මුල් නිවස බව කියයි. මහා භාරතය (අර්ජුන උත්තරා කුමරියට රූකඩ වලට විසිතුරු ඇඳුම්) කාම සූත්‍ර කාමශාස්ත්‍ර (ප්‍රේමය වර්ධනය වීමට රූකඩ නැටුම් ආදිය නරඹන්න) පුරාණ (ශිවගෙන් ප්‍රාණය ලද පාර්වතියගේ ලී බෝනික්කා) බාලරාමායණය (රූකඩ නළුවන් දෙදෙනකු රඟපෑම) ථෙරීගාථා වැනි ඓතිසික මූලාශ්‍ර වලින් තොරතුරු ඉදිරිපත් කරන පිෂේල් රූකඩ නැටවීමට

දීර්ඝ ඉතිහාසයක් ඇති බව ප්‍රකාශ කරයි. සූත්‍රධාර සහ ස්ථාපක යන සම්භාව්‍ය නාට්‍ය තුළ ද වැදගත් චරිත ද්වය ස්වකීය මතය සනාථ කිරීම පිණිස ප්‍රබල ම සාධක දෙකක් ලෙස ඉදිරිපත් කරන ඔහු පවසන්නේ රූකඩ නැටවීමෙහි දී නූල් දරන්නා සහ රූකඩ තැන්පත් කොට තබන්නා යන දෙදෙනාගේ අතිශයින් වැදගත් භූමිකා දෙක පසුව සංස්කෘත නාට්‍යයෙහි ද දක්නට ලැබුණු බව යි.

ප්‍රබල සාධක සහ සාක්ෂ්‍ය සහිත ව සිය මතය ප්‍රකට කිරීමට පිෂෙල් දැඩි උත්සාහයක නිරත වුව ද එය ද විචාරකයන්ගේ පොදු සම්භාවනාවට පාත්‍ර වූ මතයක් නොවීය. කීත් සහ රිජ්වේ එය මුළුමනින් ම ප්‍රතික්ෂේප කරත්, එම ප්‍රතික්ෂේපය පිෂෙල්ගේ මතය ඉඳුරා නිෂ්ප්‍රභයට හේතුවක් නොවන අතර ම ඔහු විසින් පෙරපරදිග රූකඩ නාට්‍යයන්හි සබඳතාවන් ප්‍රකට කිරීමත් සූත්‍රධාර ආදී චරිත පිළිබඳ ව ඉදිරිපත් කළ විග්‍රහයන් නව මුහුණුවරක් ගත් බව පැවසිය යුතු ය.

09. ඡායා නාටකය සං.නා. යේ ප්‍රභවයට බලපාන්නට ඇතැයි රූකඩ නාට්‍යයේ බලපෑම පිළිබඳ අදහස් ඉදිරිපත් කළ පිෂෙල් තවදුරටත් ප්‍රකාශ කරයි. ඡායා නාටක යනු භාරතයේ ජනප්‍රිය ව පැවති රංග සම්ප්‍රදයක් බවත් පසුව භාරතීය සංස්කෘතිය සමඟ තායිලන්තය, මලයාව, ජාවා, කාම්බෝජනය, බාලි දූපත් ජපානය, චීනය, තුර්කිය වැනි රටවලටත් පැතිරිණි යි පවසන පිෂෙල් සකු නළුවට ඉන් විශේෂ බලපෑමක් ඇතිවන්නට ඇතැයි පවසයි. "රූපවල පිළිබිඹු වන ඡායා මාර්ගයෙන් සකස් කළ නාට්‍ය" යන අදහස ධ්නිත වන ඡායා නාටක සංස්කෘත නාට්‍යයට සිදුකළ බලපෑම ප්‍රකට වන සාධක කිහිපයක් පිෂෙල් ඉදිරිපත් කරයි.

- ඡායා නාටක නම් ව්‍යවහාර වෙන පසුකාලීන නාට්‍ය කෘති 07ක් දක්නට ලැබීම (උදා:- දූතාංගද)
- මහාභාරතයේ සඳහන් රූපොපජීව නම් ජනපදය (මෙහි භාෂ්‍යයට අනුව සිනිඳු රෙදි තිරයක් පසුපස සිට රජ මැති ඇමතින්ගේ ක්‍රියා නිරූපණය කරන්නන්)
- ජාවා, බාලි, මලයා, තායිලන්ත යන රටවල ප්‍රකට ඡායා නාටකයන්හි රාමායණ වීරයන් දක්නට ලැබීම.
- මහාභාෂ්‍යයේ "සෞභනිකා" යනු ඡායා (සෙවනැලි) විස්තර කරමින් කථාව පැහැදිලි කළෝ වෙති. - ල්‍යුඩර්ස
- අශෝක ශිලා ලේඛනයක සඳහන් රූප යන පදයෙන් ඡායා නැටුමක් හැඟවේය යන විශ්වාසය.

මේ ඔහු සහ පසුව සහයට ඉදිරිපත් වූ ල්‍යුඩර්ස් ඉදිරිපත් කරන සාධක යි. එයින් ඡායා සහ රූකඩ යන සම්ප්‍රදයයන් දෙක භාරතීය දෘශ්‍ය කාව්‍යයෙහි විකාශයට ප්‍රබල ම බලපෑමක් ඇති කළ බැව් සෙසු විචාරකයනට පිළිගැන්වුණු නමුත් සකු නළුවේ මූල බීජය ලෙස පිළිගන්වන්නට ප්‍රමාණවත් නොවිණි.

10. සකු නළුවේ ප්‍රභවය පිළිබඳ ව ම නොවෙතත් එහි ඉතිහාසය විමසීමේ දී වැදගත් අදහස් ඉදිරිපත් කළ ශ්‍රී ලාංකේය විද්වතෙක් ලෙස නන්දදේව විජේසේකර මහතා හඳුන්වා දිය හැකි ය.

"බෞද්ධ සූත්‍ර සාහිත්‍යයේ ඉතිහාස කාල නිර්ණය සැක සහිත වීම නිසා එහි සඳහන් නාට්‍ය පිළිබඳ පුවත් නොසලකා හළ යුතු බැව්" කීත් පවසයි. මෙයට පිළිතුරු සපයමින් පාලි නිකාය ග්‍රන්ථ වලින් ප්‍රබල වූත් විශ්වාසදායී වූත් සාධක ගෙන හැර පාන විජේසේකර මහතා කීත් ගේ මතය ප්‍රතිෂ්ඨා රහිත කරයි. නිකාය ග්‍රන්ථයන්ගේ පැරණිකම පළමුව ප්‍රකට කරන විජේසේකර සංයුක්ත නිකායේ ගාමණී සංයුක්තයෙන් දීඝනිකායේ සාමඤ්ඤඵල සූත්‍රයෙන් තොරතුරු ගෙන හැර පාමින් බුදුරදුන් ජීවමාන සමය වන විටත් භාරතීය නාට්‍ය කලාවේ ප්‍රභවය සිදුව පැවති බැව් පවසයි.

"එකමන්තං නිසින්නො ඛො තාලපුටො නටගාමණී භගවන්තං එතදවොච. යො සො නටො රංගමජ්ඣෙ, සමජ්ජමජ්ඣෙ සච්චාලිකෙන ජනං හාසෙති රමෙති" (නටගාමණී සුත්තං)

"තෙ එවරූපං විසූකදස්සනං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං නච්චං ගීතං වාදිතං පෙක්ඛං අක්ඛානං පාණිස්සරං වෙතලං කුම්භථූනං, සොභනගරකං....... (සාමඤ්ඤඵල)

11. ඉහතින් සඳහන් කළ සෑම මතයක් ම භාරතීය නාට්‍ය කලාවේ ඉතිහාසය ආර්‍ය ජන සමාජයක් පදනම් කරගෙන ම විස්තර කරන්නට උත්සාහ කරයි. ආචාර්‍ය ශේඛර් එයට වෙනස් ව යමින් ආර්‍යයන් භාරතයේ ආධිපත්‍යය පැතිරවීමටත් පෙර යුගයක සිට නාට්‍යය පැවතිනැයි පවසයි. ආර්‍යයන් පැමිණීමට ප්‍රථමයෙන් භාරතයේ මොහෙන්දොජාරෝ සහ හරප්පා නගරාශ්‍රිත ව දියුණු ශිෂ්ටාචාරයක් පැවතුණි. ආර්‍යාගමනයෙන් එකී ශිෂ්ටාචාරයන් බිඳ වැටුනේ නමුත් යම් යම් ලක්ෂණ ශේෂ ව පැවතුණි. එලෙස පැවතුණු අංග ඇසුරු කරගෙන (ද්‍රවිඩ ලක්ෂණ පදනම් කරගෙන) සාහිත්‍ය කලා ආගම් දර්ශන ආදිය පැන නැගුණු බව ඉතිහාසඥයො පවසති. ආචාර්‍ය ශේඛර් පවසන්නේ නාට්‍ය කලාව ද එලෙස ම ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙන් ඇරඹී ආර්ය සමාජය තුළ දී විකාශයට පත් වූ කලාවක් බව යි.

- මොහෙන්දොජාරො - හරප්පා නගර නටඹුන් අතරින් සොයාගත් නටන දෙවිකෙනෙකුගේ සහ නළඟනක ගේ මුද්‍රා සහ වෙනත් සංස්කෘතික වස්තූන් ස්වකීය මතය තහවුරු කිරීම පිණිස ශේඛර් උපයෝගී කරගනියි. ඒ සමග ම විද්වතුන් භාරතීය නාට්‍ය කලාව පිළිබඳ අධ්‍යයනය කරන සමය වන විට ඉන්දු නිම්න යුගය පිළිබඳ ඓතිහාසික තොරතුරු ඔවුන් සතුව නොපැවතීම වෛදික ආර්‍ය සංස්කෘතිය කෙරෙහි පමණක් ඔවුන්ගේ අවධානය යොමු වීමට හේතුව ලෙස ශේඛර් දක්වයි.

12. ශක බලපෑම පිළිබඳ අදහස ඉදිරිපත් කරන්නේ සිල්වන් ලෙවීය. (Keith 6972) ශකවරුන් භාරතය ආක්‍රමණය කළ නිසා ග්‍රීක බලපෑම ඉවත් වූ බවත් භාරතීය නාට්‍යය ශකවරුන්ගේ බලපෑමෙන් වර්ධනය වූ බවත් ඔහු පවසයි. "ශකාර" චරිතය "ස්වාමින්" වැනි ආමන්ත්‍රණ සිය මතය සනාථ කිරීමට ඔහු සාධක ලෙස යොදා ගනියි. නමුත් ක්‍රි.පූ. අවදියේ භාරත නාට්‍යය ඇරඹිණැයි සලකන විට ම මෙම මතය ප්‍රතික්ෂිප්ත වේ.

13. සංස්කෘත නාට්‍යයේ ප්‍රභවය කෙරෙහි ග්‍රීක බලපෑමක් ඇතැයි වීබර් සහ වින්ඩිෂ් පළමුව අදහස ඉදිරිපත් කළහ. මේ සඳහා ඔවුන් ඉදිරිපත් කළ සාධක රැසකි.

- ග්‍රීක සේනාබලයත් සමඟ ග්‍රීක සංස්කෘතිය පන්ජාබය, ගුජරාටය වැනි භාරතීය භූමීන්ට පැමිණෙන්නට ඇත.
- එකී ග්‍රීක පාලන ප්‍රදේශවල නාට්‍ය රඟ දැක්වෙන්නට ඇත.
- ගද්‍ය පද්‍යමය භාරතීය නාට්‍යය අත්වැල් සහ කථනමය ග්‍රීක නාට්‍යයට සමාන ය.
- අවස්ථානුකෘතිර් නාට්‍යයම් (ධනංජය) - මිමසිස් (mimesis) අනුකරණ විග්‍රහය)
- විට, විදූෂක සහ ශකාර - පැරසයිට්
- පාත්‍රයන් හඳුන්වාදී වේදිකාගත කරවීම දෙපසෙහි ම සමානවීම.
- ජවනිකා යන භාරතීය වදන ග්‍රීසිය හෝ ග්‍රීකයන් හඳුන්වන යවන යන්නෙන් නිපයීම.
- සංස්කෘත සුඛාන්ත ග්‍රීක හාස්‍යෝත්පාදක නාට්‍යයන්ට (Comody) සමාන වීම.
- ග්‍රීක බලපෑම දැඩි ව ම පැවති යුගයක මුල් ම සංස්කෘත නාට්‍යය බිහිවීම.

මෙලෙස වීබර් වින්ඩිෂ් ඉදිරිපත් කළ අදහස පසුව කීත් සහ රිජ්වේ විසින් තවදුරටත් තහවුරු කිරීමට උත්සුක කැරේ. රිජ්වේ ඉදිරිපත් කළ මළවුන් පිදීමේ චාරිත්‍රය පිළිබඳ අදහස මෙයට ම සමගාමී ය. භාරතීයයන්ගේ තාක්ෂණික ඥානය සහ නිර්මාණ කෞශල්‍යය පිළිබඳ ව අවඥාසහගත ව බලන කීත් "ඉන්දියාවේ එවකට පැවති උපකරණ සහ තාක්ෂණික ඥානය පදනම් කරගෙන කවර මිනිස් කොටසකටත් මනා නාට්‍ය ක්‍රමයක් බිහිකළ නොහැකි බවත් ග්‍රීක සංස්කෘතියේ සභ්‍යත්වයේ බලපෑමෙන් භාරතීය නාට්‍ය කලාව නිර්මාණය සහ සංවර්ධනය වූ බවත් කියයි.

එසේ නමුත් පිෂෙල්, දසගුප්ත, දේ, විල්සන් වැනි විචාරකයන් විසින් ග්‍රීක බලපෑම පිළිබඳ උක්ත තර්ක ක්‍රමානුකූල ව බිඳ හෙළේ. එහි දී ඔවුන් ඉදිරිපත් කෙරුණු පිළිතුරු මෙලෙස පිඩු කළ හැකි ය.

- භාරතයේ විශේෂයෙන් සංස්කෘතයේ නට, නාට්‍ය (නෘත් - to dance) වදන් භාවිත වූයේ ග්‍රීකයන් පැමිණීමටත් පෙර සිට ය.
- එයින් ගායනා සහ නැටුම් සම්ප්‍රදයක් වාච්‍ය විය.
- ජවනිකා යනු යවන යන්නෙන් නොව වැඩීම් අරුත් දෙන යමනිකා සහ වෛදික භාෂා ප්‍රයෝගයෙන් සිද්ධ වූවකි (යමනිකා - සෘජුර්වේද වාජසෙනීය සංහිතා)
- ග්‍රීක වේදිකාවේ තිරයක් නොවී ය.
- ග්‍රීකයන්ගේ නාට්‍ය ශෝකාන්ත ය. නමුත් සං.නා. ශෘංගාරාත්මක ය. වඩාත් සමීප වන්නේ ඉංග්‍රීසි නාට්‍ය සම්ප්‍රදයට ය.
- හඳුන්වාදීමේ ප්‍රයෝග සංස්කෘතයේ නාට්‍යයට පමණක් සීමා වූවක් නොව සෙසු කාව්‍යයන්හි ද දැකගත හැකි ය.
- විට විදූෂක ශකර ආදීහු හාස්‍ය ජනනය අතින් යම් සමානතාවයක් ප්‍රකට කළ ද ආවේණික සුවිශේෂ භාරතීය චරිත ස්වභාව සහිත ය. ඒවා විමසන විට පැරසයිට්ට අසමාන ය.

- ග්‍රීක ශෝකාන්ත නාට්‍ය උසස් වේ. බිය ශෝකය දනවීමෙන් භාව විශෝධනය ඔවුන්ගේ පරමාර්ථය වේ. භාරතීයයන්ගේ උසස් ම නිර්මාණ සුඛාන්ත ය. ධර්ම අර්ථ කාම මෝක්‍ෂ පරමාර්ථ කොට ඒවා නිෂ්පාදිත ය.
- ග්‍රීක නාට්‍ය පොදු මහජනතාවට - භාරතීය නාට්‍ය උසස් රුචියක් ඇති අයට
- සකු නාට්‍යය උසස් කාව්‍යමය නිර්මාණ වේ. ග්‍රීක නාට්‍ය එසේ නොවේ.
- භාෂා සම්මිශ්‍රණය භාරතීය නාට්‍යයේ සුවිශේෂ ලක්‍ෂණයකි. ග්‍රීක නැත.
- විශාල චරිත සංඛ්‍යාවක් සකු නාට්‍යයේ දැකිය හැකි ය. නමුත් ග්‍රීක නාට්‍යයක නළුවන් අති සීමිත ය. 05ක් පමණක් වේ.
- සකු නළුවේ කාන්තාවෝ රඟුහ. ග්‍රීක නාට්‍යයේ නැත.
- සකු නාට්‍යය ගෘහස්ථ රංග ශාලාවක රාත්‍රී කාලවල - ග්‍රීක එළිමහන් සුවිශාල රංගයක දිවා කල 'කොලොසියම'(-ග්‍රීකයන්ගේ නාට්‍ය රංග ශාලාව).
- ග්‍රීකයන් වෙස්මුහුණු සහ විප්‍රලම්භ චරණ භාවිත අතර සකුවෝ මුද්‍රා සහ අභිනය වැනි සියුම් රංගොපක්‍රම භාවිතා කළහ.

සංස්කෘත නාට්‍ය කලාවේ ඉපැරණි බව සහ එහි ප්‍රභවය කෙසේ වීදැයි යන්න වෛදික සාහිත්‍යය, එයටත් පෙර සිට පැවති ජන සම්ප්‍රදායයන්, ආගමික පූජා විධීන්, වීර කාව්‍යයන්, බෞද්ධ සාහිත්‍යය, ව්‍යාකරණ ග්‍රන්ථයන්,අශ්වඝොෂ නාට්‍ය නිර්මාණයන් සහ මෙකී මතයන් තුළින් පිළිබිඹු වෙයි.

---

මූලාශ්‍රය :- තිලකසිරි, ජේ. සංස්කෘත නාට්‍ය සාහිත්‍යය. 2000, ද්විතීයමුද්‍රණය. ගොඩගේ, කොළඹ.